04. ලකුණු ලබාදීමේ ක්‍රමය :-

සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති ඖෂධවේදී විශේෂ ශ්‍රේණියේ තනතුරට උසස් කිරීම සඳහා වූ සවිස්තරාත්මක ලකුණු පරිපාටිය අනුව ලකුණු ලබාදෙන නිර්ණායක පහත පරිදි වේ.

| අනු අංකය | නිර්ණායක | විස්තරය සහ වෙන් කළ ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| 01. | සේවා පළපුරුද්ද | විශේෂ ශ්‍රේණියට අයදුම් කිරීමේ මූලික අවශ්‍යතාවය වන I ශ්‍රේණියේ වසර 05 ඉක්මවන, I පන්තියේ සහ අධි ශ්‍රේණියේ සේවා කාලය (I පන්තියේ වසර පහකට (05) වැඩි සේවා කාලය, අධි ශ්‍රේණිය ද ඇතුළත්ව) (වසරකට ලකුණු 05) (උපරිම ලකුණු 60) | ලකුණු 60 |
| 02. | අමතර අධ්‍යාපන සුදුසුකම් | **i.** සේවයට බඳවා ගැනීමේ මූලික අවශ්‍යතාවයට අමතරව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් ඖෂධ විද්‍යාව හෝ ඖෂධවේදය පිළිබඳ ආචාර්ය උපාධිය හෝ **M.Phil.** දර්ශනපති උපාධිය (අදාළ උපාධි සහතික මගින් සනාථ කළ යුතුය) (උපාධියකට ලකුණු 30 ) | ලකුණු 30 |
| | | **ii.** සේවයට බඳවා ගැනීමේ මූලික අවශ්‍යතාවයට අමතරව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් ඖෂධ විද්‍යාව හෝ ඖෂධවේදය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (අදාළ උපාධි සහතික මගින් සනාථ කළ යුතුය) (උපාධියකට ලකුණු 25) | |
| | | **iii.** සේවයට බඳවා ගැනීමේ මූලික අවශ්‍යතාවයට අමතරව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් ඖෂධ විද්‍යාව හෝ ඖෂධවේදය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය (උපාධියකට ලකුණු 20) **(NVQ Level 07)** (අදාළ උපාධි සහතික මගින් සනාථ කළ යුතුය) | |
| | | **iv.** සේවයට බඳවා ගැනීමේ මූලික අවශ්‍යතාවයට අමතරව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් රසායන විද්‍යාව විෂයයක් ලෙස අන්තර්ගතව ස්වභාවික විද්‍යාව පිළිබඳ උපාධියක් හෝ කළමනාකරණය හෝ පරිපාලනය පිළිබඳ වෙනත් උපාධි හෝ පශ්චාත් උපාධි සුදුසුකමක් (අදාළ උපාධි සහතික මගින් සනාථ කළ යුතුය) **(NVQ Level 07)** (උපාධියකට ලකුණු 15) | |
| | | **v.** රැකියාවට කෙළින්ම සම්බන්ධ නැති ක්ෂේත්‍රයක වුවද, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් වෙනත් ඕනෑම උපාධියක්, ශාස්ත්‍රපති උපාධියක්, **PHD, M.Phil** (අදාළ උපාධි සහතික මගින් සනාථ කළ යුතුය) (උපාධියකට ලකුණු 10) | |
| | | **vi.** සේවයට බඳවා ගැනීමේ මූලික අවශ්‍යතාවයට අමතරව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් රැකියාවට අදාළ ක්ෂේත්‍රයක හෝ තොරතුරු තාක්ෂණ, කළමනාකරණය හෝ පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාව (අදාළ ඩිප්ලෝමා සහතික මගින් සනාථ කළ යුතුය) **(NVQ Level 05, 06)** (ඩිප්ලෝමාවකට ලකුණු 05) | |
| | | **vii.** සේවයට බඳවා ගැනීමේ මූලික අවශ්‍යතාවයට අමතරව ලබාගත් රැකියාවට අදාළ ක්ෂේත්‍රයක හෝ තොරතුරු තාක්ෂණයේ හෝ කළමනාකරණයේ හෝ පරිපාලනයේ සහතික පත්‍ර පාඨමාලාවක් (අදාළ සහතික මගින් සනාථ කළ යුතුය) **(NVQ Level 04)** (සහතිකයකට ලකුණු 01) | |

| | | | |
|---|---|---|---|
| 03. | විශේෂ කුසලතාවයන් | **i.** වසරකට නොඅඩු කාලයක් වැඩබලන පදනම මත ප්‍රාදේශීය ඖෂධවේදී තනතුරේ කටයුතු කිරීම. (අදාළ තනතුරෙහි වැඩබැලීම් කටයුතු සිදු කළ බවට ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ සහතිකය)<br>(මාස 06 ට වැඩි වසරකට අඩු කාලය සඳහා ලකුණු - 1/2)<br>සම්පූර්ණ වසරක් සඳහා ලකුණු - 01) (ලකුණු 04) | ලකුණු 10 |
| | | **ii.** වසර 02 කට නොඅඩු කාලයක් මූලික රෝහල් මට්ටමින් ඉහළ ආයතනයක හෝ ප්‍රාදේශීය වෛද්‍ය සැපයුම් අංශයේ හෝ ප්‍රධාන ඖෂධවේදී තනතුරේ කටයුතු කර තිබීම.(අදාළ ආයතන ප්‍රධානියා මගින් නිකුත් කරනු ලබන සනාථ කිරීමේ සහතිකය)<br>(වසරකට ලකුණු ½ බැගින්) (ලකුණු 02) | |
| | | **iii.** දිස්ත්‍රික්කය සඳහා වාර්ෂික ඒකාබද්ධ ඇස්තමේන්තුව සකස් කිරීම සහ සමාලෝචනය කිරීම සඳහා සහභාගී වී තිබීම.<br>(උපරිම 01)<br>(අදාළ සහතික මගින් සනාථ කළ යුතුය) (ලකුණු 01) | |
| | | **iv.** ජාත්‍යන්තර සඟරාවක පළ වූ රැකියා ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ පත්‍රිකාවක පළමු කතුවරයා වීම.<br>ශ්‍රී ලංකා ජර්නලයක/ සඟරාවක පළ වූ රැකියා ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ පත්‍රිකාවක පළමු කතුවරයා වීම.<br>ජාත්‍යන්තර සඟරාවක පළ වූ රැකියා ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ පත්‍රිකාවක පළමු සම කර්තෘවරුන් තිදෙනාට ඇතුළත් වීම.<br>ශ්‍රී ලංකා ජර්නලයක/ සඟරාවක පළ වූ රැකියා ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ පත්‍රිකාවක පළමු සම කර්තෘවරුන් තිදෙනාට ඇතුළත් වීම.<br>රැකියාවට අදාළ ක්ෂේත්‍රයක ප්‍රකාශිත පොතක කර්තෘ වීම.<br>(උපරිම 01)<br>(අදාළ ලේඛන මගින් සනාථ කළ යුතුය) (ලකුණු 01) | |
| | | **v.** රැකියාවට අදාළ ක්ෂේත්‍රයක සේවාස්ථ පුහුණු වැඩසටහනක සම්පත්දායකයෙකු ලෙස සහභාගී වීම.<br>(අදාළ සහතික මගින් සනාථ කළ යුතුය)<br>(උපරිම 01) (ලකුණු 01) | |
| | | **vi.** රෝගීන් සඳහා පවත්වන ලද උපදේශන සැසිවල සාක්ෂි (අදාළ ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කරනු ලබන විශේෂඥ වෛද්‍ය නිලධාරියාගේ ලිපියක්)<br>රෝගීන් සඳහා සිදු කරන ලද ඖෂධ ප්‍රතිසන්ධාන කටයුතු **(Medical Reconcilliation)** පිළිබඳ සාක්ෂි<br>(අදාළ ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කරනු ලබන විශේෂඥ වෛද්‍ය නිලධාරියාගේ ලිපියක්)<br>(උපරිම 01) (ලකුණු 01) | |

<u>සැලකිය යුතුයි</u>

සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවයට ලකුණු ලබාදීමක් සිදු කරනු නොලැබේ.

05. ඖෂධවේදී බඳවා ගැනීම් පරිපාටියේ 10.4.5.හි (අ) වගන්තිය ප්‍රකාරව විශේෂ ශ්‍රේණියට උසස් කිරීමට අදාළ මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අනුව අයදුම්පත් කැඳවා සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් පවත්වා එයින් ඉහළම ලකුණු ලැබුවන් ලකුණුවල කුසලතාවය අනුව පුරප්පාඩු සඳහා පත් කරනු ලැබේ. ඖෂධවේදී තනතුරෙහි අධි ශ්‍රේණියේ/ I ශ්‍රේණියේ අදාළ තනතුරු දරන නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙළ අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයකට නොවැඩි සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එසේ සම්මුඛ පරීක්ෂණය සඳහා අදාළ නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතා ලේඛනයේ අනුපිළිවෙළ අනුව කැඳවනු ලබන බැවින් යම් අයදුම්කරුවෙකු සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් නොවන්නේ නම් ඒ පිළිබඳව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ හා ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම් මගින් මෙම කොමිෂන් සභා කාර්යාලයට ලිඛිතව දැනුම් දිය යුතුය.

